# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1971/17 - 2016 ජුනි මස 15 වැනි බදාදා - 2016.06.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවාව පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

1 වැනි සංශෝධනය

අංක 1880/26 දරන 2014.09.19 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවාව පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016 ජුනි මස 15 වැනි දින.

(01) 6.1 උප ඡේදය යටතේ සඳහන් වගුව ඉවත් කර ඒ වෙනුවට නව 6.1 වගුව ආදේශ කෙරේ.

කෘෂි සංවර්ධන, කෘෂි පර්යේෂණ, කෘෂි ආර්ථික විද්‍යා හා පොදු ධාරාව යටතේ අනුමත තනතුරු සංඛ්‍යාව :-

| ශ්‍රේණිය | වැටුප් කේතය | කෘෂි සංවර්ධන ධාරාව | කෘෂි පර්යේෂණ ධාරාව | කෘෂි ආර්ථික විද්‍යා ධාරාව | පොදු ධාරාව (ධාරා එකකට වැඩි ගණනකට අයත්) | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| විශේෂ | SL-03-2006 | 1 | - | - | 4 | 5 |
| 1 | SL-01-2006 | 47 | 50 | 2 | 36 | 135 |
| 11 | SL-01-2006 | 84 | 28 | 2 | 28 | 142 |
| 11/111 | SL-01-2006 | 126 | - | 1 | 2 | 129 |
| 111 | SL-01-2006 | 342 | 382 | 23 | - | 747 |

1A - G 23653 — 10 (2016/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(02) 6.2 උප ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :- 1153

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම සඳහා 111, 11 හා 1 ශ්‍රේණි ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

(03) 7.1 හි සටහන 1 යටතේ සඳහන් තනතුරු නාම පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

කෘෂි සංවර්ධන ධාරාව යටතේ ඇති,

"සහකාර අධ්‍යක්ෂ (කෘෂි සංවර්ධන)" යන්න "සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි සංවර්ධන)" ලෙස ද,

"කථිකාචාර්ය - බස්නාහිර පළාත" යන්න "කථිකාචාර්ය - බස්නාහිර පළාත් සභාව" ලෙස ද ,

කෘෂි පර්යේෂණ ධාරාව යටතේ ඇති ,

"සහකාර අධ්‍යක්ෂ (කෘෂි පර්යේෂණ)" යන්න "සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි පර්යේෂණ) " ලෙස ද,

කෘෂි ආර්ථික විද්‍යා ධාරාව යටතේ ඇති ,

"සහකාර අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා)" යන්න "සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා) "ලෙස ද,

(04) 7.1 හි සටහන 2 ඉවත් කර ඒ වෙනුවට නව සටහන 2 ආදේශ කෙරේ.

*සටහන 2* - එක් එක් ධාරාවන් යටතේ වන තනතුරු සංඛ්‍යාවන් පහත පරිදි වේ. එක් එක් ධාරාව යටතේ වන තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව මත බඳවා ගනු ලැබේ.

| | | |
|---|---|---|
| කෘෂි සංවර්ධන | - | 470 |
| කෘෂි පර්යේෂණ | - | 382 |
| කෘෂි ආර්ථික විද්‍යා | - | 24 |

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ අනුමත කර ඇති ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ 11/111 ශ්‍රේණිවලට අයත් නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ තනතුරු 2 ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහය යටතේ අනුමත සේවක සංඛ්‍යාව ගැලපීමේ දී කෘෂි සංවර්ධන ධාරාවට අයත් සේ සලකා 470ක් ලෙස එම සේවක සංඛ්‍යාව යටතේ ඇතුළත් කර ඇත.

(05) 7.2.5 උප ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.
7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : *රජයේ ගැසට් පත්‍රයේ* පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මගින්

(06) 8.1 වගුවේ තෙවන තීරය ඉවත් කර, ඒ වෙනුවට පහත සඳහන් නව තෙවන තීරය ආදේශ කරනු ලැබේ.

| කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය (ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලා/ වෙනත්) |
|---|
| ලිඛිත (3 වන පරිශිෂ්ටය බලන්න) |
| ලිඛිත (4 වන පරිශිෂ්ටය බලන්න) |
| ලිඛිත පර්යේෂණ නිබන්ධනයක්/ ලිඛිත නිබන්ධනයක් ( 5 වන පරිශිෂ්ටය බලන්න) |

(07) 8.3 උප ඡේදයේ (අ) කොටස ඉවත් කර, ඒ වෙනුවට නව (අ) කොටස ආදේශ කරනු ලැබේ.

(අ) පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

I හා II ප්‍රශ්න පත්‍ර (මූල්‍ය ක්‍රම හා පරිපාලනය ප්‍රශ්න පත්‍ර)

කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වනු ලබන බලධාරියා

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් හෝ කෘෂිකර්ම විෂයය භාර ලේකම්වරයා විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්.

(08) 9.1 වගුවේ අනෙක් රාජ්‍ය භාෂාවට අදාළව ලබා ගත යුතු ප්‍රවීණතාව පිළිබඳව සඳහන් පේළියේ ඇතුළත් වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නව වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

"රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතු ය".

(09) 11.1 වගුව වෙනුවට පහත දැක්වෙන නව 11.1 වගුව ආදේශ කරනු ලැබේ.

11.1

| තනතුරු නාමය | ආයතනය | සුදුසුකම් |
|---|---|---|
| අතිරේක ලේකම් | කෘෂිකර්ම අමාත්‍යාංශය | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ විශේෂ ශ්‍රේණියේ අදාළ ධාරාවේ නිලධාරියෙකු වීම |
| කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම අමාත්‍යාංශය | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I වැනි ශ්‍රේණියේ අදාළ ධාරාවේ නිලධාරියෙකු වීම |
| අධ්‍යක්ෂ | කෘෂිකර්ම අමාත්‍යාංශය | |
| අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| ප්‍රධාන කෘෂි විද්‍යාඥ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| ප්‍රධාන කෘෂි විශේෂඥ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ/පළාත් අධ්‍යක්ෂ | පළාත් සභා | |
| අතිරේක අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| පළිබෝධනාශක පාලනය කිරීමේ රෙජිස්ට්‍රාර් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| අතිරේක අධ්‍යක්ෂ | වාරිමාර්ග අමාත්‍යාංශය | |
| අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ | පළාත් සභා | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II වනශ්‍රේණියේ හෝ I වැනි ශ්‍රේණියේ අදාළ ධාරාවේ නිලධාරියෙකු වීම |
| නියෝජ්‍ය පළිබෝධනාශක පාලනය කිරීමේ රෙජිස්ට්‍රාර් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | සේවා සංස්කරණ පුහුණු ආයතනය - බෝඹුවල | |
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ/පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | පළාත් සභා | |

තනතුරු ධාරාවන් අනුව වර්ගීකරණය 1 වැනි උපලේඛනයේ දැක්වේ.

(10) 11.2 උප ඡේදය ඉවත් කර, ඒ වෙනුවට නව 11.2 උප ඡේදය ආදේශ කරනු ලැබේ.

11.2 තෝරා ගනු ලබන ක්‍රමය :-

අධ්‍යක්ෂ, දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යක්ෂ, පළිබෝධනාශක පාලනය කිරීමේ රෙජිස්ට්‍රාර්, ප්‍රධාන කෘෂි විද්‍යාඥ හා ප්‍රධාන කෘෂි විශේෂඥ තනතුරු සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ වසර තුන (03)ක පළපුරුද්ද සහිත නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා, I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයකට නො වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පටිපාටියකට අනුව තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

එම තනතුරුවල I ශ්‍රේණියේ වසර තුන (03)ක පළපුරුද්දක් සහිත නිලධාරීන් අයදුම්කර නොමැති අවස්ථාවල දී, ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා, I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයකට නො වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පටිපාටියකට අනුව තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

නියෝජ්‍ය අධ්‍යක්ෂ, නියෝජ්‍ය පළිබෝධනාශක පාලනය කිරීමේ රෙජිස්ට්‍රාර්, තනතුරු සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් හෝ II ශ්‍රේණියේ වසර තුන (03)ක පළපුරුද්දක් සහිත නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා, ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයකට නො වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පටිපාටියකට අනුව තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

එම තනතුරු සඳහා I ශ්‍රේණියේ නිලධාරීන් හෝ II ශ්‍රේණියේ වසර තුන (03)ක පළපුරුද්දක් සහිත නිලධාරීන් අයදුම්කර නොමැති අවස්ථාවල දී, ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා, II ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයකට නො වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පටිපාටියකට අනුව තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

(11) 11.2 යටතේ ඇති වගුව වෙනුවට පහත දැක්වෙන නව වගුව ආදේශ කරනු ලැබේ.

| තනතුරු නාමය | ආයතනය | පත් කිරීමේ ක්‍රමය |
|---|---|---|
| කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබේ |
| අතිරේක ලේකම් (කෘෂි සංවර්ධන) | කෘෂිකර්ම අමාත්‍යාංශය | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ |
| අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) | කෘෂිකර්ම අමාත්‍යාංශය | |
| අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම අමාත්‍යාංශය | |
| අධ්‍යක්ෂ | කෘෂිකර්ම අමාත්‍යාංශය | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ |
| අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| ප්‍රධාන කෘෂි විද්‍යාඥ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| ප්‍රධාන කෘෂි විශේෂඥ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| පළිබෝධනාශක පාලනය කිරීමේ රෙජිස්ට්‍රාර් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| අතිරේක අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| අතිරේක අධ්‍යක්ෂ | වාරිමාර්ග අමාත්‍යාංශය | |
| පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ/ පළාත් අධ්‍යක්ෂ | පළාත් සභා | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ |
| අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ | පළාත් සභා | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ |
| නියෝජ්‍ය පළිබෝධනාශක පාලනය කිරීමේ රෙජිස්ට්‍රාර් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | සේවා සංස්කරණ පුහුණු ආයතනය - බෝඹුවල | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ |
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ/ පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | පළාත් සභා | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ |

(12) පළමු උපලේඛනයේ ඇතුළත් වගුව වෙනුවට පහත දැක්වෙන නව වගුව ආදේශ කරනු ලැබේ.

අනුමත තනතුරු නාම හා අනුමත තනතුරු සංඛ්‍යාවන්

| අනු අංකය | අනුමත තනතුරු නාම | ආයතනය | තනතුරු සංඛ්‍යාව | අයත් ධාරාව | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| 1 | අතිරේක ලේකම් (කෘෂි සංවර්ධන) | කෘෂිකර්ම අමාත්‍යාංශය | 01 | කෘෂි සංවර්ධන/ කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා | විශේෂ |

| අනු අංකය | අනුමත තනතුරු නාම | ආයතනය | තනතුරු සංඛ්‍යාව | අයත් ධාරාව | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| 2 | අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) | කෘෂිකර්ම අමාත්‍යාංශය | 01 | කෘෂි සංවර්ධන/ කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා | විශේෂ |
| 3 | කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 01 | කෘෂි සංවර්ධන/ කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා | |
| 4 | අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 01 | කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා | |
| 5 | අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 01 | කෘෂි සංවර්ධන | |
| 6 | අධ්‍යක්ෂ (කාබනික පොහොර)<br>අධ්‍යක්ෂ (කෘෂි තාක්ෂණ) | කෘෂිකර්ම අමාත්‍යාංශය | 02 | කෘෂි සංවර්ධන/ කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා | I |
| 7 | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම අමාත්‍යාංශය | 25 | කෘෂි සංවර්ධන/ කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා | |
| 8 | අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු/බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන/ තොරතුරු හා සන්නිවේදන) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 03 | කෘෂි සංවර්ධන | |
| | අධ්‍යක්ෂ (උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන/ වී පර්යේෂණ හා සංවර්ධන/ ක්ෂේත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන/ පලතුරු භෝග පර්යේෂණ හා සංවර්ධන) | | 04 | කෘෂි පර්යේෂණ | |
| | අධ්‍යක්ෂ (සමාජ ආර්ථික හා සැලසුම්) | | 01 | කෘෂි ආර්ථික විද්‍යා | |
| | අධ්‍යක්ෂ (බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ/ ස්වාභාවික සම්පත් කළමනාකරණ) | | 02 | කෘෂි සංවර්ධන/ කෘෂි පර්යේෂණ | |
| 9 | ප්‍රධාන කෘෂි විද්‍යාඥ<br>(ශාඛ අභිජනනය - එළවළු, මල් හා අල භෝග/ පලතුරු භෝග/ ක්ෂේත්‍ර භෝග/ වී/මාෂ හා තෙල් භෝග)<br>(ශෂ්‍ය විද්‍යා-එළවළු, මල් හා අල භෝග/ පලතුරු භෝග/ක්ෂේත්‍ර භෝග/වී/මාෂ හා තෙල් භෝග)<br>(ශාඛ ව්‍යාධි විද්‍යා - එළවළු, මල් හා අල භෝග/ පලතුරු භෝග/ක්ෂේත්‍ර භෝග/ වී/මාෂ හා තෙල් භෝග)<br>(කීට විද්‍යා - එළවළු, මල් හා අල භෝග/ පලතුරු භෝග/ ක්ෂේත්‍ර භෝග/ වී/මාෂ හා තෙල් භෝග) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 37 | කෘෂි පර්යේෂණ | |

| අනු අංකය | අනුමත තනතුරු නාම | ආයතනය | තනතුරු සංඛ්‍යාව | අයත් ධාරාව | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| | (පාංශු විද්‍යා - එළවළු, මල් හා අල භෝග/ පලතුරු භෝග/ක්ෂේත්‍ර භෝග/වී/ මාෂ හා තෙල් භෝග) (වල් පැලෑටි විද්‍යා - වී/වෙනත් භෝග) (ජෛව තාක්ෂණය/ජෛව මිතිය/විෂ විද්‍යාව/විශ්ලේෂණ රසායනය/පැළෑටි ජාන සම්පත්/බීජ තාක්ෂණය/ ජල කළමනාකරණය හා පාංශු සංරක්ෂණය/ ස්වාභාවික සම්පත් කළමනාකරණය/ශාඛ නිරෝධායනය/කෘෂි දේශගුණ විද්‍යාව) | | | | |
| 10 | ප්‍රධාන කෘෂි විශේෂඥ (කෘෂිකර්ම සංනිවේදන/කෘෂිකර්ම ව්‍යාප්ති/ කෘෂිකර්ම අධ්‍යාපන/ කෘෂිකර්ම පුහුණු ක්‍රමවේද/වී/ක්ෂේත්‍ර භෝග/ මාෂ භෝග හා තෙල් භෝග/ එළවළු හා අල භෝග/ මී මැසි පාලන/ පලතුරු/ විශේෂිත තාක්ෂණ /ආහාර තාක්ෂණය හා පෝෂණ/ කෘෂිකාර්මික යාන්ත්‍රීකරණය) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 13 | කෘෂි සංවර්ධන | I |
| 11 | පළිබෝධනාශක පාලනය කිරීමේ රෙජිස්ට්‍රාර් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 01 | කෘෂි පර්යේෂණ | |
| 12 | අතිරේක අධ්‍යක්ෂ (ව්‍යාප්ති/අධ්‍යාපන/පුහුණු/ විභාග/කෘෂි ව්‍යාපාර/තොරතුරු හා සන්නිවේදන - මූලස්ථාන/තොරතුරු හා සංනිවේදන - ජාතික කෘෂි තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය/ ගුවන්විදුලි ගොවි සේවාව/ කෘෂි ප්‍රකාශන/බීජ වී හා වෙනත් ක්ෂේත්‍ර භෝග/ එළවළු බීජ හා රෝපණ ද්‍රව්‍ය/ බීජ අර්තාපල්/ සංවර්ධන - බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 13 | කෘෂි සංවර්ධන | |
| | අතිරේක අධ්‍යක්ෂ (පර්යේෂණ/ සංවර්ධන - උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය/ රතිල, මාෂ හා තෙල් භෝග පර්යේෂණ හා සංවර්ධන/ ක්ෂේත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන/ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, කිලිනොච්චිය/පලතුරු භෝග පර්යේෂණ හා සංවර්ධන/ වී පර්යේෂණ හා සංවර්ධන/ පැළෑටි ජාන සම්පත්) | | 08 | කෘෂි පර්යේෂණ | I |
| | අතිරේක අධ්‍යක්ෂ (සමාජ ආර්ථික හා සැලසුම්) | | 01 | කෘෂි ආර්ථික විද්‍යා | |

| අනු අංකය | අනුමත තනතුරු නාම | ආයතනය | තනතුරු සංඛ්‍යාව | අයත් ධාරාව | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| | අතිරේක අධ්‍යක්ෂ (ස්වාභාවික සම්පත් කළමනාකරණ /බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ/ පැළෑටි සංරක්ෂණ/බීජ සහතික කිරීම/ ජාතික පැළෑටි නිරෝධායන සේවය) | | 05 | කෘෂි සංවර්ධන/ කෘෂි පර්යේෂණ | I |
| | අතිරේක අධ්‍යක්ෂ (ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම්) | | 01 | කෘෂි සංවර්ධන/ කෘෂි ආර්ථික විද්‍යා | |
| 13 | අතිරේක අධ්‍යක්ෂ | වාරිමාර්ග අමාත්‍යාංශය | 01 | කෘෂි සංවර්ධන/ කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා | |
| 14 | පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ/පළාත් අධ්‍යක්ෂ | පළාත් සභා | 09 | කෘෂි සංවර්ධන | |
| 15 | අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ | පළාත් සභා | 09 | කෘෂි සංවර්ධන | |
| 16 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති - මූලස්ථාන/විභාග/අධ්‍යාපන - මූලස්ථාන/පුහුණු - මූලස්ථාන/අන්තර් පළාත්-අම්පාර, හසලක, මොණරාගල, පොලොන්නරුව /අනුරාධපුරය, හම්බන්තොට/කෘෂි ව්‍යාපාර පුහුණු/ උද්‍යාන භෝග පුහුණු හා සංවර්ධන ආයතනය, බිබිල/ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය, කුණ්ඩසාලේ, පැල්වෙහෙර, වවුනියාව, අඟුණකොලපැලැස්ස, කරපිංච/සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය, ගන්නෝරුව, අඟුණකොල-පැලැස්ස/ගොවිපල් යාන්ත්‍රික අභ්‍යාස මධ්‍යස්ථානය /තොරතුරු හා සන්නිවේදන - මූලස්ථාන/ ගුවන් විදුලි ගොවි සේවා/ කෘෂි තොරතුරු හා උපදේශන සේවාව/ තොරතුරු සන්නිවේදන තාක්ෂණ/කෘෂි සංචාර ප්‍රවර්ධන හා කෘෂි තාක්ෂණ උද්‍යාන/කෘෂි ප්‍රදර්ශන/ ග්‍රැෆික් සන්නිවේදන හා පුහුණු /වීඩියෝ නිෂ්පාදන/ප්‍රකාශන/ බීජ වී/වෙනත් ක්ෂේත්‍ර බෝග/ එළවළු බීජ/ රෝපණ ද්‍රව්‍ය/ බීජ අර්තාපල්/ගොවිපල් සංවර්ධන හා ප්‍රගති මෙහෙයුම්/ගොවිපල් කළමනාකරණ හා අලෙවි/බීජ හා රෝපණ ද්‍රව්‍ය - කොළඹ,කුණ්ඩසාලේ, අලුත්තරම, අම්පාර, නිකවැරටිය, නුවරඑළිය, බටඅත, පොළොන්නරුව, පැල්වෙහෙර, කන්තලේ, මහඉළුප්පල්ලම, වවුනියාව, පරන්තන්) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 49 | කෘෂි සංවර්ධන | II |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය/ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, මාකඳුර/ ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල/ | | 27 | කෘෂි පර්යේෂණ | |

| අනු අංකය | අනුමත තනතුරු නාම | ආයතනය | තනතුරු සංඛ්‍යාව | අයත් ධාරාව | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| | කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, සීතාඑළිය/ කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය , ගිරාඳුරු-කෝට්ටේ/කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, තෙලිජ්ජවිල/ ආහාර පර්යේෂණ ඒකකය, ගන්නෝරුව/කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, කල්පිටිය/ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, මහඉලුප්පල්ලම - 1/11/ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, කරදියන්ආරු/ ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අරලගංවිල/ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, කිලිනොච්චිය/රනිල, මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අඟුණකොළපැලැස්ස/කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, තිරුනෙල්වේලි/පැලෑටි වෛරස් වර්ගීකරණ මධ්‍යස්ථානය, හෝමාගම/ පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, හොරණ/ පලතුරු බෝග පර්යේෂණ මධ්‍යස්ථානය, ගන්නෝරුව/ කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, මදුරුකැටිය/ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ/ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, බෝඹුවල/ කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, අම්බලන්තොට/ කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, ලබුදූව/ කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, සමන්තුරේ /කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, පරන්තන්/ පැළෑටි ජාන සම්පත් ඇගයීම, ජෛව තාක්ෂණය හා දත්ත කළමනාකරණය - පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය/ජාන සම්පත් ගවේෂණය හා සංරක්ෂණය - පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය) | | | | II |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>(සමාජ ආර්ථික හා සැලසුම්-1/11) | | 02 | කෘෂි ආර්ථික විද්‍යා | |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>(බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ/ බීජ සහතික කිරීමේ සේවය - මූලස්ථාන/ බීජ පනත / වී සහ ක්ෂේත්‍ර බෝග සහතික කිරීම/ බීජ ස්වස්ථතාව හා ප්‍රභේද පරීක්ෂාව/ බහු වාර්ෂික බෝග සහතික කිරීම/ පැළෑටි සංරක්ෂණ/බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ - ඌව, වයඹ, බස්නාහිර, නැගෙනහිර, උතුර, උතුරු මැද , දකුණ, සබරගමුව/ජාතික පැළෑටි නිරෝධායන සේවය, කටුනායක/පැළෑටි නිරෝධායන ඒකකය, ගුවන් තොටුපොල, කටුනායක/ පැළෑටි නිරෝධායන ඒකකය, ගුවන් තොටු පොල, මත්තල/පැළෑටි නිරෝධායන | | 26 | කෘෂි සංවර්ධන/<br>කෘෂි පර්යේෂණ | |

| අනු අංකය | අනුමත තනතුරු නාම | ආයතනය | තනතුරු සංඛ්‍යාව | අයත් ධාරාව | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| | ඒකකය, කොළඹ වරාය/ පැළෑටි නිරෝධායන ඒකකය, හම්බන්තොට, වරාය/ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය -මූලස්ථාන/පනත් හා රෙගුලාසි/ භූමි පරිහරණ කළමනාකරණය/ භූ දත්ත තාක්ෂණය හා දුරස්ථ සංවේදනය/ජල ද්‍රෝණි කළමනාකරණය/ වාරිමාර්ග සහ කාලගුණය) | | | | II |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය - 1/11) | | 02 | කෘෂි සංවර්ධන/ කෘෂි ආර්ථික විද්‍යා | |
| 17 | නියෝජ්‍ය පළිබෝධනාශක පාලනය කිරීමේ රෙජිස්ට්‍රාර් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 01 | කෘෂි පර්යේෂණ | |
| 18 | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ/ පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | පළාත් සභා | 35 | කෘෂි සංවර්ධන | |
| 19 | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ | කෘෂිකර්ම අමාත්‍යාංශය | 02 | කෘෂි සංවර්ධන/ කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා | |
| 20 | සහකාර/ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ, සහකාර/ නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ, සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ , සහකාර/ නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ | පළාත් සභා | 118 | කෘෂි සංවර්ධන | |
| 21 | කෘෂි ආර්ථික විද්‍යාඥ | බස්නාහිර පළාත | 01 | කෘෂි ආර්ථික විද්‍යා | II/III |
| 22 | කථිකාචාර්ය | බස්නාහිර පළාත | 01 | කෘෂි සංවර්ධන | |
| 23 | විෂයානුගත විශේෂඥ | සේවා සංස්කරණ පුහුණු ආයතනය - බෝඹුවල | 03 | කෘෂි සංවර්ධන | |
| 24 | සහකාර/නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන - හොරණ,හෝමාගම,වල්පිට, අඹේපුස්ස | 04 | කෘෂි සංවර්ධන | |
| 25 | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි සංවර්ධන) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 342 | කෘෂි සංවර්ධන | |
| 26 | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි පර්යේෂණ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 382 | කෘෂි පර්යේෂණ | III |
| 27 | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 23 | කෘෂි ආර්ථික විද්‍යා | |

13. දෙවන පරිශිෂ්ටයේ 2 වන පත්‍රය පිළිබඳව ඇතුළත් වන ඡේදයේ 2 වන වගන්තිය වෙනුවට පහත දක්වා ඇති වගන්තිය ආදේශ කරනු ලැබේ.

"එක් එක් අයදුම්කරුවෙකු විසින් තමන් ඉල්ලුම් කරනු ලබන තනතුරට අදාළ වන පරිදි පහත සඳහන් ප්‍රශ්න පත්‍ර අතුරින් තෝරා ගනු ලබන ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටීමට අවකාශ ඇත"

14. පස් වැනි පරිශිෂ්ටයේ පළමු ඡේදය පහත දක්වා ඇති පරිදි සංශෝධනය කරනු ලැබේ.

3 වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සඳහා නිලධාරින් විසින් සම්පූර්ණ කළ යුතු සුදුසුකම්

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පශ්චාත් උපාධි සුදුසුකම් තීරණය කරනු ලබන කමිටුව විසින් පිළිගනු ලබන ලිඛිත පර්යේෂණ නිබන්ධනයක්/ලිඛිත නිබන්ධනයක් සම්පූර්ණ කර තිබීම.

07 - 153

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.